www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජනාධිපති කම්කරුවන්ට එරෙහිව ආර්ථික යුද්ධයකට සැරසෙයි

## Sri Lankan president prepares for "economic war" on workers

**සම්පත් පෙරේරා හා කේ රත්නායක විසිනි**

**2009 මැයි 9**

ජනාධිපති රාජපක්ෂ පසුගිය සතියේ සිය මැයි දින කථාවේදී ජාතිය ගොඩනැඟීමේ නාමයෙන් රටේ ආර්ථික අර්බුදයේ බරට කරගැසිය යුතුය යන පනිවිඩය වැඩ කරන ජනතාව වෙත කෙලින්ම නිකුත් කලේය.

රාජපක්ෂ සිය නිල නිවසේ සංවිධානය කල මැයි දින රැස්වීමට තම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) හා පාලක සභාගයේ අනෙකුත් පාර්ශවකරුවන් ගනනාවකගේ වෘත්තීය සමිති නිලධරයන්ට ඇරයුම් කර තිබුනි. ශ්‍රීලනිප කොලඹ හා අවට "වැඩකර රට ගොඩනගමු" යන සටන් පාඨය සහිත පෝස්ටර් අලවා තිබුනි.

සිය කථාවේදී ජනාධිපති ආන්ඩුවේ හමුදාවන්ට ප්‍රශංසාව පුදකරමින් මිලිටරියේ ජයග්‍රහන පිලිබඳව පාරම්බෑවේය. දැනට හමුදාව සිය ගනනක් සිවිල් වැසියන් මරාදමමින් හා විශාල සංඛ්‍යාවකට තුවාල සිදු කරමින් එල්ටීටීඊ යටතේ පවතින අවසාන බිම්කඩ අත්පත්කර ගැනීම සඳහා දරුනු සටනක යෙදී සිටියි.

කම්කරු පන්තියේ මිතුරෙකු ලෙස පෙනී සිටිමින් රාජපක්ෂ හිටපු ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග යටතේ කම්කරු ඇමති වශයෙන් කටයුතු කල අවධිය සිහිගැන්වීය. කෙසේ වුවද එම තනතුර හොබවද්දී කම්කරුවන් වෙනුවෙන් ඉටුකල කිසිවක් ගැන සඳහන් කිරීමට ඔහු අපොහොසත් විය.

2005 දෙසැම්බරයේ ඔහු බලයට පත්වූ තැන් පටන් "ගතවූ තෙවසර වැඩ වර්ජන හා කාර්මික ආරවුල් අවම වශයෙන් වාර්තාගතවූ කාලයයි. අපට කම්කරු ශුභසාධනය වර්ධනය කිරීමටත් ඉහල කාර්මික සාමයක් පවත්වාගැනීමටත් හැකියාව ලැබුනි" යයි ඔහු පම්පෝරි ගැසීය.

සැබවින්ම ආන්ඩුව, සිය රැකියා හා ජීවන තත්වයන් ආරක්ෂාකර ගැනීමට කම්කරුවන් කල අරගල මැඬීම සඳහා කුරිරු ලෙස යුද්ධය උපයෝගී කරගෙන තිබුනි. වැටුප් ඉල්ලීම් ප්‍රතික්ෂේප කල රාජපක්ෂ රැකියා කප්පාදු කරමින් අවධාරනය කර සිටියේ මිලිටරිය වෙනුවෙන් මුදල් වැය කල යුතුව ඇති බවයි. "ඔබ මගෙන් ඉල්ලන්නේ උතුරෙන් හමුදා ඉවත්කර ගන්ට දැයි" වෘත්තීය සමිති නායකයන්ට ඔහු අභියෝග කල විට ඔවුහු වහාම හකුලා ගත්හ.

අරගලවලට පැමිනි කම්කරුවන්ට "එල්ටීටීඊයට ආධාර කරන්නේ" යයි චෝදනා කල අතර ඔවුන්ගේ වැඩ වර්ජන බිඳීම සඳහා පොලිසිය හා මිලටරිය යොදවනු ලැබුනි. කම්කරු පන්තියේ වියදමෙන් රාජපක්ෂ "කාර්මික සාමය" ඇතිකලේ ඒ ආකාරයෙනි.

කෙසේ වුවද ඔහුගේ මැයි දින කථාවේදී ජනාධිපති අලුත් තානයක් වාදනය කලේය. "අපගේ වීරෝධාර හමුදාවෝ වසර තුනක කාලය පුරා පැය 8 නොව පැය 24 ම සේවයෙහි යෙදෙමින් රට රැකගත්හ. ඔවුන් කැප කලේ ඔවුන්ගේ පුද්ගලික ජීවිතය පමනක් නොවේ. ඔවුන්ගේ සමස්ත ජීවිතයම රට වෙනුවෙන් කැප කලහ."යනුවෙන් ඔහු හඬ නැඟීය.

"රටේ වැඩ කරන ජනතාව ද ඔවුන්ගෙන් පාඩමක් ඉගෙන ගත යුතුය. අප රටේ ජනතාව සිතිය යුත්තේ තමන් වැඩ කරන පැය ගනන ගැන නොව අවංකව සේවයට කැපවීම පිලිබඳව ය. එසේ වුවහොත් මේ රට වසර දෙක තුනක් තුල ලෝකයේ වැදගත් තැනකට ඔසවාලිය හැකිය."

එය වැඩි දුරටත් අවධාරනය කිරීම සඳහා ජනාධිපති මෙසේ ද පැවසීය. "අපගේ සියලු ව්‍යවසායකයන් හා බැංකුකරුවන් තමන් සතුව පිට රටවල ඇති මුදල් රට ගොඩනැඟීම සඳහා ගෙන ආ යුතුය. වැඩ කරන ජනතාව වැඩෙහිදී උපරිම ඵලදායිතාව පෙන්වමින් හා ව්‍යාපාරික සැලසුම්වල ශක්තිය වැඩි දියුනු කරමින් ඊට දායක විය යුතුය."

හමුදාවේ ජයග්‍රහන සාමය හා සමෘද්ධිය නොව ගෙන එන්නේ වැඩ කරන ජනතාවගේ රැකියා, ජීවන තත්වයන් හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එරෙහිව නව රුදුරු ප්‍රහාරයක් බව ජනාධිපතිගේ කථාවෙන් කම්කරු

පන්තියට කෙරෙන තියුනු ම අනතුරු ඇඟවීමයි. ආන්ඩුවේ ඇමතිවරු, ආධාරකරුවන් හා මාධ්‍යය "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" අවසන් වීමෙන් පසුව "ආර්ථික යුද්ධයක්" පිලිබඳව දැනටමත් කථා කිරීමට පටන් ගෙන ඇත.

රටේ ආර්ථිකය හා ආන්ඩුවේ මූල්‍ය කටයුතු දැඩි සිරවීමකට ලක්ව තිබේ. රාජපක්ෂ මිලිටරිය පුලුල් කිරීමටත්, ආයුධ හා වෙඩි උන්ඩ මිලට ගැනීම සඳහාත් ඉහල පොලී අනුපාතයන් යටතේ දේශීය හා ජාත්‍යන්තර මූල්‍ය වෙලඳපල වලින් විශාල වශයෙන් නය ලබාගෙන ඇත. පෙබරවාරි වන විට විදේශ සංචිත යාන්තමින් සති හයක ආනයන බිල ගෙවීමට පමනක් සෑහෙන ඩොලර් බිලියන 1.1 දක්වා පහත වැටුනි.

ගෙවුම් ශේෂ හිඟයක් හා විදේශ නය පැහැර හැරීමක් වලක්වා ගැනීම සඳහා ආන්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (ජාමූඅ) ඩොලර් බිලියන 1.9 නයක් බලාපොරොත්තුවෙන් සිටියි. ජාමූඅ හා ශ්‍රී ලංකා මහ බැංකුව සියයට 4.5-5 අතර වනු ඇතැයි ගනන් බලා තිබූ ආර්ථික වර්ධනය දැන් සියයට 2.2 දක්වා පහත දමා ඇත.

"දේශපාලන න්‍යායපත්‍රයක වාසිය සඳහා ජාත්‍යන්තර මූල්‍යායතන ප්‍රයෝජනයට ගැනීමටත් රටේ ආර්ථිකය ග්‍රහනයට ගැනීමට හෝ රටට අවාසිදායක කොන්දේසිවලට යටත් වීමටත්" තමන් ඉඩ නොදෙන බව රාජපක්ෂ ප්‍රකාශ කලේය.

ජනාධිපති සඳහන් කරන "දේශපාලන න්‍යායපත්‍රය" හා "කොන්දේසි" කම්කරුවන් ආරක්ෂා කිරීම සමඟ මොනම සම්බන්ධයක්වත් නැත. නම් නොකල එක්සත් ජනපද නිලධාරීන් මාධ්‍ය වෙත දැනටමත් අඟවා ඇත්තේ කොලඹ පාලන තන්ත්‍රය සටන් විරාමයක් සඳහා වූ ඉල්ලීම්වලට එකඟවීමට අසමත් වුවහොත් වොෂින්ටනය ජාමූඅ නය ප්‍රමාද කිරීමට ඉඩ ඇති බවයි. උතුරේ මිලිටරි මෙහෙයුම් සම්බන්ධ කිසිදු සීමාවක් පැනවීම රාජපක්ෂ විසින් යලි යලිත් ප්‍රතික්ෂේප කර ඇත.

කෙසේ වුවද වැඩ කරන ජනතාව සම්බන්ධයෙන් ගත් කල නම් ආන්ඩුව දැනටමත් සීමා පැනවීමේ පියවර ක්‍රියාවට නඟමින් සිටියි. මාර්තු මුලදී රාජපක්ෂ රජයේ සේවයෙහි කම්කරුවන්ට වැටුප් වර්ධක කිසිවක් නොලැබෙන බවත් අලුත් බඳවා ගැනීම් අත්හිටුවන බවත් නිවේදනය කලේය. පුද්ගලික අංශයේ කම්කරුවන් සීමිත වැටුප් මත තෙමසක කාලයකට සේවයෙන් ඉවත් කිරීම සඳහා ඉඩදෙමින් සේවා යෝජකයන් හා වෘත්තීය සමිති සමඟ එකඟතාවකට පැමිනි බව ද ආන්ඩුව නිවේදනය කලේය.

රාජපක්ෂ මැලේසියාව ආදර්ශයක් කොට ගත යුතු බව පැවසීම ද සැලකිය යුතුය. "1997-98 ආසියානු මූල්‍ය අර්බුදය අවධියේ රට ගොඩනැඟීම සඳහා මැලේසියාව පෙන්වූ එම අධිෂ්ඨානයෙන්ම අප ද වැඩ කල යුතු" බව ඔහු පැවසීය.

මැලේසියානු නිදසුනේ ප්‍රතිපලය වශයෙන් කම්කරු පන්තියට ඉමහත් දුක් පීඩා ගෙන ආවේය. ලක්ෂ ගනනක් දේශීය හා සංක්‍රමනික කම්කරුවන් සේවයෙන් පහකිරීම ද සියයට 20-50 අතර ප්‍රමානයෙන් වැටුප් කැපීම ද සමාජ සේවා වියදම් කපා දැමීම ද සිදුවිය. මැලේසියානු අගමැති මහතීර් මොහමඩ් මෙම පියවර ගනු ලැබුවේ ජාමූඅ හා එක්සත් ජනපදයේ සීමා පැනවීම්වල විරුද්ධවාදියෙකු ලෙස පෙනී සිටින අතර, කම්කරුවන් බෙදීම සඳහා ජාතිකවාදී හා මැලේ වාර්ගික මනෝගතීන් ඇවිස්සීම තුලින්ය.

1998 වසරෙන් පසුව මැලේසියාව යලි ගොඩ ආවේ මහතීර්ගේ මූල්‍ය හා ප්‍රාග්ධන පාලනයන්ගේ ප්‍රතිපල වශයෙන් නොව අපනයන වර්ධනය, විශේෂයෙන්ම එක්සත් ජනපදයට කෙරෙන, හේතුකොටගෙන ය. අනෙකුත් ගිනිකොනදිග ආසියානු රටවල් මෙන්ම මැලේසියාව ද වැඩී යන චීන ආර්ථිකය කේන්ද්‍රකොට ගත් නිෂ්පාදන ජාලයන් තුලට ඒකාග්‍ර කරගනු ලැබින. එජ, යුරෝපය හා ජපානය යන සියල්ල ආර්ථික පසුබෑමකටත්, චීනයේ වර්ධන අනුපාතය වැටීමකටත් මුහුනපා ඇති තතු තුල මැලේසියානු ආර්ථිකය මෙම වසර තුල සියයට 1 හැකිලෙනු ඇතැයි අපේක්ෂිතය.

ඇමතිවරු හා ජ්‍යෙෂ්ඨ වෘත්තීය සමිති නිලධරයන් ගනනාවක් රාජපක්ෂගේ මැයි දින රැස්වීමට සහභාගීවූහ. ආන්ඩුවට අනුබද්ධ ශ්‍රී ලංකා නිදහස් කම්කරු සංගමයේ ලේකම් ලෙස්ලි දේවේන්ද්‍ර හා සිංහල ස්වෝත්තමවාදී මහජන එක්සත් පෙරමුනේ දිනේෂ් ගුනවර්ධන ජනාධිපතිගේ කථාව වර්නනා කරමින් අදහස් දැක්වූහ. කරුනා ලෙස ප්‍රසිද්ධියට පත්ව සිටින වී මුරලිදරන් රාජපක්ෂගේ කියමන්වලට හුරේ දැමීය. මුලින්, එල්ටීටීඊ වෙතින් බිඳී ගිය සන්නද්ධ කල්ලියක නායකයෙකු වූ මුරලිදරන් පෙබරවාරි මාසයේදී ශ්‍රීලනිප සමඟ එක්වූ අතර දැන් ඇමති තනතුරක් දරයි.

ශ්‍රී ලංකාවේ දිග් ගැස්සුනු සිවිල් යුද්ධය සෑම විටම පන්ති අරගලය සමඟ බැඳී තිබුනි. 1948 නිදහසෙන් පසුව බලයට පත්වූ ආන්ඩු කම්කරු පන්තිය බෙදීම සඳහා දෙමල විරෝධී වර්ගවාදය ගසාකා තිබේ. 1983 පටන් කම්කරුවන්ගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හා මනා ජීවන තත්වයන් සඳහා වූ ඉල්ලීම් මැඩීමට යලි යලිත් යුද්ධය යොදාගනු ලැබිනි.

නිත්‍ය මිලිටරි බලයක් වශයෙන් එල්ටීටීඊය මුලුමනින්ම වාගේ විනාශ කරමින් උතුර හා නැඟෙනහිර මිලිටරි පාලනයකට නතුකල රාජපක්ෂ, නව සතුරෙකු සමඟ එනම්, සමස්ත කම්කරු පන්තිය සමඟ පොරයට සූදානම් වෙමින් සිටියි. මිනිසුන් පැය ගනන් වලට සීමා නොවී හා මැසිවිලි නැඟීමකින් තොරව වැඩ කල යුතුය යන ප්‍රකාශ පෙන්නුම් කරන්නේ මෙය ශ්‍රම කඳවුරක තන්ත්‍රයකට නොඅඩු පාලනයක් බවය. කම්කරු පන්තිය මත එවන් කොන්දේසි පැනවිය හැක්කේ ආන්ඩුවේ දෙමල විරෝධී යුද්ධයේදී යොදාගත් එම පොලිස් රාජ්‍ය විධික්‍රමයන්ම මඟින් පමනකි.

ආන්ඩුවේ ආර්ථික ප්‍රහාරයන්ට එරෙහිව කම්කරුවන් යෙදීගන්නා කුමන හෝ අරගලයක ආරම්භක ලක්ෂ්‍යය වන්නේ සියලු වර්ගයේ ජාතිවාදයන් හා ජාතෝත්තමවාදයන් පිලිකෙව් කිරීමයි. "ජාතිය ගොඩනැඟීමේ" අර්ථය රටේ කුඩා ව්‍යාපාරික පැලැන්තියේ ලාභ තර කිරීමයි. රාජපක්ෂගේ මිලිටරි යුද්ධයට හා අලුතෙන් සූදානම් කෙරෙමින් ඇති "ආර්ථික යුද්ධය" යන දෙකට ම එරෙහි වීම සිංහල, දෙමල හා මුස්ලිම් යන සියලු කම්කරුවන්ගේ පොදු අවශ්‍යතාවක් වන්නේය. උතුරෙන් හා නැඟෙනහිරෙන් සියලු හමුදා වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කිරීම පිලිබඳ ඉල්ලීම, ලාභ පද්ධතියේ ම්ලේච්ඡත්වයට එරෙහි සමාජවාදී විකල්පයක් සඳහා ජාත්‍යන්තර අරගලයේ කොටසක් ලෙස ශ්‍රී ලංකාවේ කම්කරුවන් එක්සත් කිරීමේ පදනම බවට පත්වනු ඇත

© www.wsws.org